වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වාර්ෂික වාර්තාව - 2018

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

නො. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත,
කොළඹ 07.

දුරකථන: (+94) 112 697758
(+94) 112 681052
(+94) 112 696261

වෙබ් අඩවිය: https://pgim.cmb.ac.lk

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අියතනය

මහාචාර්ය එච්.ජනක.ද.සිල්වා
අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

මහාචාර්ය සේනක රාජපක්ෂ
නියෝජ්‍ය අධ්‍යක්ෂක
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

එස්.අනූෂා
නියෝජ්‍ය ලේඛකාධිකාරී
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

දැක්ම

රටෙහි සහ කළාපයෙහි සෞඛ්‍ය අවශ්‍යතා ඉටු කිරීමත් ලෝක සෞඛ්‍ය ක්ෂෙත්‍රය කෙරෙහි දායකවීමත් උදෙසා ඉහළ කාර්යශූරත්වයෙන් යුතු විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තීකයන් බිහිකිරීමෙහි සුවිශේෂීතාව සඳහා ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථානයක් බවට පත්වීම.

විශ්ව විද්‍යාලයීය මට්ටම සාධනය කරගැනීමේ අවසන් අරමුණින් යුතුව අධ්‍යයනය, මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන ආයතනයක් බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනතාවට, කළාපයට සහ ලෝකයට ප්‍රශස්ත සහ මානුෂික සෞඛ්‍ය සත්කාරය සැලසීම වෙනුවෙන ඉහළම ගුණාත්මකභාවය, ප්‍රවීණත්වය සහ කැපවීම සහිත විශේෂඥවරුන් සහ අනෙකුත් වෘත්තිකයන් බිහිකිරීම සඳහා අවශ්‍ය පශ්චාත් අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.

අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

2018 වර්ෂය සඳහා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මා සතුටුවෙමි'

ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය වෘත්තිකයන් සහ දන්ත වෛද්‍ය වෘත්තිකයන් හට විශේෂඥ පුහුණු සැපයීම සඳහා පවතින එකම ආයතනය වන්නේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි. එතුළ වර්තමානය වනවිට ක්‍රියාත්මක වන අධ්‍යයන මණ්ඩල 23ක් සහ විශේෂ මණ්ඩල 35ක් යටතේ එම්.ඩී සහ එම් එම්.එස්.සී උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා පශ්චාත් උපාධි සහතික පත්‍ර සහ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා මණ්ඩල සහතිකධාරීත්වය පිරිනැමීම දක්වා දිවෙන අධ්‍යයන වැඩසටහන් 124 ක් අප විසින් පවත්වන ලදී. මේ වනවිට නව බඳවාගැනීම් 1007 කින් සමන්විත වූ සහ සමස්තයක් ලෙස 3921 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් ඉහත පුහුණු වැඩසටහන් සඳහා ලියාපදිංචිව සිටිති. 2018 වර්ෂයේදී අප විසින් විභාග 132 ක් පැවැත්වූ අතර එම්.ඩී උපාධි 364 ක් සහ එම් එම්.එස්.සී උපාධි 80 ක්ද, පශ්චාත් උපාධි ඩිප්ලෝමාවන් 257 ක්, පශ්චාත් උපාධි සහතික 37 ක් සහ විශේෂඥ වෛද්‍යවරුන් සඳහා මණ්ඩල සහතිකධාරීත්වයන් 199 ක් පිරිනැමීමද සිදු කරන ලදී.

මෙම වසර තුළ අපගේ දීර්ඝ කාලීන අවශ්‍යතාවයක් වූ ඉලෙක්ට්‍රොනික ගැටළු බැංකුවක් ස්ථාපනයද සිදු කරන ලදී. හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය, පර්යේෂණාගාර අණුක ව්‍යාධිවේදය පිලිබඳව එම්.ඩී. උපාධිය සහ මණ්ඩල සහතිකකරණය, සායනික ජාන විද්‍යාව පිළිබඳව පශ්චාත් එම්.ඩී. උපවිශේෂ පුහුණුව සහ මණ්ඩල සහතිකකරණය සහ ඉන්ද්‍රිය බද්ධකිරීම් නිර්වින්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව විශේෂ අවධානය යන නව පුහුණු වැඩසටහන් හතරක් සඳහා උපාධි ප්‍රකාශපත්‍ර සැකසීම අරඹන ලදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් දෙකක් ශාස්ත්‍රපති මට්ටම දක්වා ඉහළ දැමිණි. 2018 වසරේදී පවතින වැඩසටහන්හි විෂය මාලා සහ උපාධි ප්‍රකාශපත්‍ර 5 ක් ප්‍රතිශෝධනය කරන ලද අතර තවත් 8ක් ප්‍රතිශෝධනය වෙමින් පවතී.

රොඩ්නි වීදියේ ඉදිකරමින් පවතින අපගේ නව අධ්‍යයන ගොඩනැගිල්ල බොහෝදුරට සමාප්ත අතර මීලඟ වසර තුළ එහි කටයුතු ආරම්භ කළ හැකිවනු ඇත. ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ අපගේ උත්පාදිත ආදායම භාවිතා කරමින් මිලදී ගැනීමට අපේක්ෂිතය.

කළමනාකරණ මණ්ඩල සාමාජිකයන්, අධ්‍යයන මණ්ඩල, විශේෂඥ අධ්‍යයන මණ්ඩල සහ විභාග මණ්ඩල සාමාජිකයන්, පුහුණුකරුවන් සහ විභාග පරීක්ෂකයන් හට මෙම වසර තුළ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත ඔවුන්ගේ දායකත්වය පිළිබඳව මගේ ස්තුතිය පිරිනමමි එමෙන්ම තම රාජකාරි ප්‍රශංසනීය අන්දමින් ඉටුකිරීම වෙනුවෙන් අපගේ පරිපාලන සහ ලිපිකාර කාර්ය මණ්ඩලයටද මා විශේෂයෙන් ස්තුතිවන්ත වෙමි.

මහාචාර්ය එච්. ජනක ද සිල්වා
අධ්‍යක්ෂ/වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

අරමුණු

- ඉගැන්වීම්- ඉගෙනුම්, පුහුණු සහ පර්යේෂණයන්හි අඛණ්ඩ ඉහළ ස්ථාවරයන් සාක්ෂාත්කර ගැනීම.
- ජාතික සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරිය හැකි පරිදි පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම.
- රටෙහි සෞඛ්‍ය සහ වෛද්‍ය අධ්‍යාපනික ප්‍රතිපත්තීන් විධිමත්ව සකස් කිරීම සඳහා දායක වීම.
- පශ්චාත් උපාධි වෛද්‍ය අධ්‍යාපනය සහ පර්යේෂණයන් සම්බන්ධයෙන් ආයතනයේ ක්‍රියාකාරීත්වය වඩා ව්‍යාප්ත සහ පුළුල් එකක් බවට පත්කිරීම.
- ආයතනයෙහි ඉහළ යන අධ්‍යාපනික අවශ්‍යතාවන් සැපිරිය හැකි වන පරිදි සහ එහි ගුණාත්මක භාවය තහවුරු වන පරිදි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

පරමාර්ථ

- දේශීය අවශ්‍යතාව සැපිරිය හැකි පරිදි ඉහළ මට්ටමේ ගුණාත්මක භාවයකින් සමන්විත සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රමාණවත් මිනිස් සම්පතක් බිහි කිරීම.
- නිරන්තර ඉගෙනුම තුලින් සෞඛ්‍ය වෘත්තීකයින්ගේ කුසලතා සහ නිපුණතාවන් පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම.
- සෞඛ්‍ය වෘත්තීකයින් හට නිරන්තර අධ්‍යයනයන් සඳහා ඉඩ පහසුකම් සලසන ක්‍රමවේදයන් ඇතිකිරීම.
- වෛද්‍ය වෘත්තීකයින් තුළ සඵලදායක ආකල්ප සහ ස්වයං ඉගෙනුම් ප්‍රවර්ධනය කිරීම.
- පශ්චාත් උපාධි අධ්‍යයනයන්ට අදාළව පවතින සම්පත් සහ සුදුසු තාක්ෂණයන් භාවිතා කිරීම දිරිගැන්වීම.
- සෞඛ්‍ය ගැටළු විසඳීමේදී සෞඛ්‍ය සේවා කණ්ඩායම් ප්‍රවේශය භාවිතා කිරීම පිළිබඳ සංකල්පය හඳුන්වාදීම.
- දුර්වලතා සහ වැඩිදියුණු කරගතයුතු අංශ පිළිබඳව තොරතුරු රැස්කරගැනීම සඳහා වෛද්‍ය අධ්‍යාපනික වැඩසටහන් ඇගයීමට ලක් කිරීම.
- නිවාරක සහ ප්‍රතිකාරක සත්කාරයන් මෙන්ම හෙද සත්කාරයන්ද මනා ලෙස අනුකලනය වූ සේවාස්ථ වැඩසටහන් සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාව තුළ පශ්චාත් උපාධි මට්ටමේ වෛද්‍ය අධ්‍යාපනය ඉහළ මට්ටමකින් පවත්වාගැනීම සඳහා විදේශීය අධ්‍යාපනික ආයතන සමග අනෙකොන්‍ය ශුභසිද්ධිය සැලසෙන ආකාරයෙන් අධ්‍යාපනික සබඳතාවන් වැඩිදියුණු කරගැනීම.
- රටෙහි සෞඛ්‍ය සේවා අවශ්‍යතාවන් සැපිරීම මෙන්ම කලාපය සහ ලොව පුරා වෛද්‍ය විද්‍යාවේ විවිධ ක්ෂේත්‍රයනට ක්‍රියාකාරී දායකත්වයක් සපයන්නාවූ විශේෂඥ වෘත්තීකයන් බිහිකරන්නාවූද මූල්‍යමය සහ පරිපාලනමය වශයෙන් ස්වාධීනව ක්‍රියාත්මකවන ජාත්‍යන්තරව පිළිගැනීමක් සහිත විශිෂ්ට ආයතනයක් බවට පත්වීම.

අන්තර්ගතය

1. කළමනාකරණ මණ්ඩලය	1
2. ඓතිහාසික පසුබිම	3
3. සම්පත් හා සිසුන් පිළිබඳව විස්තර	5
4. දේශීය සිසුන් පිළිබඳව විස්තර	5
5. අධ්‍යයනය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	6
6. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර	6
7. පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර	7
8. වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර	7
9. නව පාඨමාලා පිළිබඳ විස්තර	8
10. පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර	9
11. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර	9
12. මූල්‍ය ප්‍රගතිය (වියදම්) පිළිබඳ විස්තර	9
13. මූල්‍ය ප්‍රගතිය (උත්පාදනය කරන ලද ආදායම්) පිළිබඳ විස්තර	10
14. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2018	10
15. 2018 වර්ෂයේදී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර	10
16. වෙනත් තොරතුරු	11
16.1අධ්‍යාපනික ක්‍රියාකාරකම්	11
16.2 ඇගයුම් සහ විභාග කටයුතු	23
16.3 පුස්තකාලය	36
16.4 සාමාන්‍ය පරිපාලනය	43
16.5 මූල්‍ය	49
17. තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව	67
18. විගණන විමසුම හා පිළිතුර	68

1. කළමනාකරණ මණ්ඩලය

කළමනාකරණ මණ්ඩලය ප්‍රධාන විධායක කමිටුව මෙන්ම පරිපාලන අධිකාරියද වෙයි.

මහාචාර්ය ජානක ද සිල්වා. අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය සේනක රාජපක්ෂ. නියෝජ්‍ය අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය ජයන්ත ජයවර්ධන. වත්මන් අධ්‍යක්ෂකවරයාට ආසන්නතම හිටපු අධ්‍යක්ෂක, පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය

මහාචාර්ය එස්.ඩී ජයරත්න **(සභාපති)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

පද්මසිරි ජයමාන්න මයා. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

වසන්ත පෙරේරා මිය,ලේකම්/ සෞඛ්‍ය

ඒ.කේ.ඩී.ඩී.ඩී ආනන්ද මයා මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නම්කල නියෝජිත

වෛද්‍යාචාර්ය අනිල් ජාසිංහ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

මහාචාර්ය ජෙනිෆර් පෙරේරා. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය ආසිරි අබේගුණවර්ධන. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය සමන් විමලසුන්දර. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, රුහුණු විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එස්. රවිරාජ් පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්'.ජී. යසවර්ධන. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය ජී.එස්. විජේසිංහ පීඨාධිපති, වෛද්‍ය විද්‍යා පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය

මහාචාර්ය ජේ.ඒ.ඩී.පී. ජයසිංහ පීඨාධිපති, දන්ත වෛද්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ඒ.එන් අරුල්ප්‍රකාශම්. පීඨාධිපති, සෞඛ්‍ය උපස්ථායක විද්‍යා පීඨය, ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

මහාචාර්ය එස්.එච්. සිරිබද්දන. පීඨාධිපති, වෛද්‍ය විද්‍යා හා ආශ්‍රිත විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

මහාචාර්ය නන්දදේව සමරසේකර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය රන්ජනී ගමගේ (මිය) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය චන්ද්‍රිකා විජේරත්න විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

වෛද්‍යාචාර්ය හර්ෂ කබ්රාල් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය ශ්‍රීනාත් චන්ද්‍රසේකර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

වෛද්‍යාචාර්ය මහානාම ගුණසේකර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් පත්කල සාමාජික

මහාචාර්ය ලක්ෂ්මන් රත්නායක සභාව මගින් නම්කල සාමාජික

ජේ.එම් ස්වාමිනාදන් මයා සභාව මගින් නම්කල සාමාජික

වෛද්‍යාචාර්ය ලාල් පනාපිටිය වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජෙනරාල් (වෛද්‍ය සේවා) - 1

වෛද්‍යාචාර්ය චන්දන ගජනායක වැඩබලන නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (දන්ත වෛද්‍ය සේවා)

වෛද්‍යාචාර්ය සුදත් සමරවීර වැඩබලන නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ)

මහාචාර්ය වී.පී. වික්‍රමසිංහ. පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය එම්. වී.පී. පින්ටෝ පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය කේ. මුකුන්දන් පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය යාපනය විශ්ව විද්‍යාලය

මහාචාර්ය දීපක වීරසේකර පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

මහාචාර්ය ඒ.පී.ද සිල්වා. පීඨ නියෝජිත/ වෛද්‍ය විද්‍යා පීඨය කැළණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ඩබ්.එම්.පී.එස්.කේ. විජේකෝන් පීඨ නියෝජිත/ දන්ත වෛද්‍ය විද්‍යා පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය එම්. තිරුකුමාර්. පීඨ නියෝජිත/ සෞඛ්‍ය උපස්ථායක විද්‍යා පීඨය ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය

වෛද්‍යාචාර්ය ආර්.එස්.පී.බී. තලගස්පිටිය. වෛද්‍ය විද්‍යා හා ආශ්‍රිත විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය

2. ඓතිහාසික පසුබිම

1870 වර්ෂයේ දී ලංකා වෛද්‍ය විද්‍යාලය ස්ථාපනය කිරීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ වෛද්‍ය අධ්‍යාපනය ආරම්භ වූ අතර 1942 දී ලංකා විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් අනතුරුව එහි වෛද්‍ය පීඨය බවට පත්වන්නේ මෙම ලංකා වෛද්‍ය විද්‍යාලයයි . එම්.ඩී සහ එම්.ඕ.ජී උපාධි පිරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1952 වර්ෂයද එම්.එස් උපාධිය පිරිනැමීම සඳහා විභාග පැවැත්වීම ආරම්භවූ 1953 වර්ෂයද වනතුරුම ලංකා විශ්වවිද්‍යාලය මගින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ප්‍රදානය සඳහා විභාග පවත්වනු නොලැබිණ.

එවකට ලංකාව තුළ ව්‍යූහාත්මක හෝ සංවිධිතාත්මක පශ්චාත් උපාධි පුහුණුකිරීම් සිදු නොකෙරුණූ අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි පුහුණුව ලබාගත හැකිවූයේ එක්සත් රාජධානියේ පැවැති වෛද්‍ය විද්‍යායතන මගිනි. ඒවායින් පිරිනමනු ලැබූ MRCP, FRCS,FFARCS, MRCOG, FRCR,MRCPath,MRCPsych සහ FDSRCS වැනි සුදුසුකම් විශේෂඥ වෛද්‍යවරුන් පත්කිරීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල මගින් පිළිගන්නා ලද සුදුසුකම් විය. මෙම විදේශ පුහුණුව වෙනුවට අධීක්ෂණය කරනු ලැබීමට යටත්ව තෙවසරක සේවාස්ථ පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව විභාගයක් පැවත්වියයුතු බව 1973 වසරේදී වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අධ්‍යාපනය පිළිබඳ උපදේශක කමිටුවක් මගින් රජයට නිර්දේශ ඉදිරිපත්කරනු ලැබීය. ඒ අනුව, 1972 අංක 1 දරන ලංකා විශ්ව විද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1976 වසරේ දී පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (ෂජඇඑ) ස්ථාපනය කර කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කරනු ලැබීය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්, වෛද්‍ය හැල්ෆ්ඩෑන් මාහ්ලර් විසින් 1976 මාර්තු 2 වන දින පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය (PGIM) නිල වශයෙන් ආරම්භකරනු ලැබූ අතර මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් පත්විය.

කෙසේ වුවද, එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් පවත්වනු ලැබූ විභාග කොළඹ දී පැවැත්වීම අඛණ්ඩව සිදුවීමත්, වෛද්‍ය වෘත්තිකයන් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විභාගවලට පෙනීසිටීමට වඩා එක්සත් රාජධානියේ විභාගවලට පෙනී සිටීමට ප්‍රියමනාපභාවයක් දැක්වීම හේතුකොටගෙන අභිනවයෙන් පිහිටුවනු ලැබූ ආයතනයේ කටයුතු අඩාල විය. එබැවින්, මෙම ආයතනයේ ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම අවශ්‍ය විය. එක්සත් රාජධානියේ විද්‍යායතන මගින් ශ්‍රී ලංකාව තුළ විදේශීය පශ්චාත් උපාධි විභාග පැවැත්වීම 1980 ජනවාරි 1 වනදා සිට ක්‍රියාත්මකවන පරිදි නවතාලීමටත්, මෙම ආයතනය මගින් ලබාදෙන පශ්චාත් උපාධි සඳහා පූර්ණ පිළිගැනීමක් ලබා දීමට සහ වැඩි සැලකිල්ලක් දැක්වීමටත් රජය තීරණය කරන ලදී.

ආයතනයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණින් මෙම ආයතනය 1978 අංක 16 දරනවිශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ 1979 වසරේ දී නැවත ස්ථාපනය කර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය(PGIM) ලෙස නැවත නම්කරනු ලැබීය. වෛද්‍ය එස්.ඒ. කබ්රාල් මහතා එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා ලෙස පත්කරනු ලැබීය. ඒ අනුව, ඉහත සඳහන් කරන ලද විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ සම්පාදනය කරන ලද 1980 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥාපනත අංක 1 1980 අප්‍රේල් මස 10 වනදා සිට බලාත්මක විය. වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කරනු ලැබූ අතර නිර්වින්දනවේදය, ප්‍රජා වෛද්‍යවිද්‍යාව, දන්ත ශල්‍යවේදය, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය කර්මය, වෛද්‍යවිද්‍යාව, නාරිවේදය හා ප්‍රසවවේදය, අක්ෂිවේදය, ව්‍යාධිවේදය, ළමාචිකිත්සාව, මනෝචිකිත්සාව, විකිරණවේදය සහ ශල්‍යවේදය වැනි විවිධ විශේෂඥතාවන් සඳහා පාඨමාලා හා විභාග සංවිධානය කරන ලදී. 1985 වසරේ දී තවත් අධ්‍යයන මණ්ඩල හතරක් එනම්, වෝහාරික වෛද්‍ය විද්‍යාව, වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව, කර්ණ නාසික ස්වරාලවේදය සහ සායනික අර්බුදවේදය ස්ථාපනයකරනු ලැබීය. මහාචාර්ය ආර්.ජී. පානබොක්කේ මහතා 1990 වසරේ දී මෙම ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්විය. වෛද්‍ය පරිපාලනය සහ චර්මවේදය පිළිබඳ අධ්‍යයන

මණ්ඩල 1994 දී ද, මෛථුනවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල 2001 වසරේ ද ස්ථාපනය කරන ලදී. වෛද්‍ය ජේ.බී.පීරිස් මහතා 1995 වසරේ ද, මහාචාර්ය ලලිතා මෙන්ඩිස් මහත්මිය 2002 වසරේ ද, මහාචාර්ය රෙස්වි ෂෙරීෆ් මහතා 2006 වසරේ ද, මහාචාර්ය ජයන්ත ජයවර්ධන 2012 වසරේ ද, මහාචාර්ය එච්.ජානක ද සිල්වා මහතා 2014 වසරේ ද මෙම ආයතනයේ අධ්‍යක්ෂවරුන් ලෙස පත්වූහ.නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර 2011 වසරේ දී ස්ථාපනය කරන ලද අතර මහාචාර්ය ජයන්ත ජයවර්ධන, මහාචාර්ය ප්‍රශාන්ත විජේසිංහ, මහාචාර්ය ක්‍රිෂාන්ත අබේසේන සහ මහාචාර්ය සේනක රාජපක්ෂ මෙම ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර දැරූහ. 1980 ආඥාපනත සඳහා සිදුකරන ලද සංශෝධන 2014 ජූලි 1 වන දින සිට බලාත්මකවූ අතර සංශෝධිත ආඥාපනත යටතේ නව අධ්‍යයන මණ්ඩල කීපයක් සහ විවිධ විශේෂඥතාවන් සඳහා අධ්‍යයන මණ්ඩල කීපයක් ස්ථාපනය කරන ලදී.

3. සම්පත් හා සිසුන් පිළිබඳව විස්තර

පාඨමාලාව	පුහුණු ලාභීන් සංඛ්‍යාව	සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය
පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලා	13	*
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	610	*
එම්. එස්. සී	285	*
පූර්ව එම්.ඩී සහ එම්. ඩී I කොටස	1546	*
පශ්චාත් එම්.ඩී (දේශීය)	672	
එම්.ඩී (විදේශීය)	651	*
එකතුව	**3921**	

*ක්ෂේත්‍ර විශේෂඥයින්ගේ සේවය බාහිර කථිකාචාර්යවරුන් ලෙස ලබාගනු ලැබේ

4. දේශීය සිසුන් පිළිබඳව විස්තර

පාඨමාලාව	2017 කාණ්ඩය	පළමු වසර	දෙවන වසර	තෙවන වසර	සිවුවන වසර	පස්වන වසර	හයවැනි වසර	හත්වැනි වසර	එකතුව
සහතික පත්‍ර		23							23
පශ්චාත් උපාධි ඩිප්ලෝමා	339	547	114						661
එම්. එස්.සී.	171	218	56						274
සේවාස්ථ/1 කොටස	58	47	65						112
එම්.ඩී.	521	521	513	411	461	76	52		2034
එතෙර පුහුණු					298	307	39	2	646
එකතුව	**1089**	**1356**	**748**	**411**	**759**	**383**	**91**	**2**	**3750**

5. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

පීඨය/ශාඛාව	විෂයය/විෂය ක්ෂේත්‍රය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	සහකාර කථිකාචාර්ය උපදේශක	වෙනත්
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	අධ්‍යක්ෂ	01					
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	නියෝජ්‍ය අධ්‍යක්ෂ		01				
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	සායනික විද්‍යා			01			
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	වෛද්‍ය අධ්‍යාපනය			01			
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව විශේෂ අවධානයක් සහිත වෛද්‍ය අධ්‍යාපනය			01			
අධ්‍යයන	පාඨමාලා සම්බන්ධීකාරක						04
වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	තාවකාලික පර්යේෂණ සහකාර						02
පුස්තකාල	ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති						02

6. අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳව තොරතුරු

පීඨය/ශාඛාව	පරිපාලන	අධ්‍යයන සහාය	තාක්ෂණික කාර්ය මණ්ඩලය	ලිපිකරු සහ සමාන්තර	සුළු සේවක
අධ්‍යක්ෂක කාර්යාලය	-	-	-	01	01
අතිරේක රෙජිස්ට්‍රාර් කාර්යාලය	01	-	-	01	-
සාමාන්‍ය පරිපාලන	01	-	-	10	08
පරිගණක ඒකකය	-	02	-	01	-
වෛද්‍ය නිදර්ශන ඒකකය	-	-	01	-	-

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය	-	01	-	01	01
මූල්‍ය	02	-	-	10	02
විභාග	03	-	01	21	03
අධ්‍යයන	02	-	-	16	04
පුස්තකාලය	-	-	-	10	05

7. පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳව විස්තර

විෂයය	**භාරදීම්**
පර්යේෂණ සංඛ්‍යාව (මේ වනවිට සිදුකරමින් පවතින)	22
උපාධි නිබන්ධන සහ විද්වත් රචනා සංඛ්‍යාව	-
ලිපි සහ පත්‍රිකා සංඛ්‍යාව	25
එකතුව	**47**

8. වැඩසටහන් සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳව විස්තර

විෂයය	**සහභාගී වූ සංඛ්‍යාව**	**සම්පූර්ණ කළ සංඛ්‍යාව**
පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව		06
උපාධි වැඩසටහන් සංඛ්‍යාව	NR	NR
ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව	NR	NR
සහතිකපත්‍ර වැඩසටහන් සංඛ්‍යාව	NR	NR
වෙනත් පශ්චාත් උපාධි සහතිකපත්‍ර වැඩසටහන්		NR
	එකතුව	**75**

9. නව පාඨමාලාවන් පිළිබඳව විස්තර

2018 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් නව පුහුණු වැඩසටහන් සඳහා උපාධි ප්‍රකාශපත්‍ර සැකසීමට කටයුතු යොදන ලදී.

- ඉන්ද්‍රිය බද්ධකිරීම් නිර්විින්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව විශේෂ අවධානය සහිත නිර්විින්දනවේදය පිලිබඳව මණ්ඩල සහතිකධාරීත්වය.

2019 වසරේදී ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් නව පුහුණු වැඩසටහන් සඳහා උපාධි ප්‍රකාශපත්‍ර සැකසීමට කටයුතු යොදන ලදී.

- හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය,
- පර්යේෂණාගාර අණුක ව්‍යාධිවේදය පිලිබඳව එම්.ඩී. උපාධිය

පවතින වැඩසටහන්හි පහත සඳහන් විශය මාලාවන් සහ උපාධි ප්‍රකාශපත්‍ර මෙම වසර තුළදී සංශෝධනය කරන ලදී.

- වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකධාරීත්වය.
- ප්ලාස්ටික් සහ ප්‍රතිනිර්මිත ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය.
- ස්නායු ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය
- වෘක්ක ව්‍යාධිවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය
- මෛත්‍ර ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය
- අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන
- වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි වැඩසටහන (වත්මන වනවිට වෘද්ධ චිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි වැඩසටහන ලෙස යළි නම් කර ඇත)
- වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස් සී වැඩසටහන
- භ්‍රෑණ වෛද්‍ය කර්මය පිළිබඳව පශ්චාත් එම්.ඩී උපවිශේෂ පුහුණුව සහ මණ්ඩල සහතිකධාරීත්වය සහ මෛත්‍ර ප්‍රසවවේදය පිළිබඳව පශ්චාත් එම්.ඩී උපවිශේෂ පුහුණුව සහ මණ්ඩල සහතිකධාරීත්වය.

පහත වැඩසටහන් මේ වනවිටත් සංශෝධනය කරමින් පවතී

- වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.ඩී. වැඩසටහන (AAAEC අනුමැතිය සහිත, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂිතය)
- සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
- වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
- සායනික ප්‍රවේණි විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
- වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී. වැඩසටහන
- ව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- සාමාන්‍ය දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

10. පුනරාවර්තන වියදම් පිළිබඳව විස්තර

විෂයය	2017 රුපියල්	2018 රුපියල්
පුද්ගල පඩිනඩි	132,776,383	146,420,195
ගමන් වියදම්	13,687,370	7,669,559
සැපයුම්	10,135,025	9,167,917
නඩත්තු වියදම්	4,583,772	4,835,600
ගිවිසුම්ගත සේවාවන්	26,666,427	29,966,114
වෙනත් පුනරාවර්තන වියදම්	95,070,362	101,134,012
පශ්චාත් උපාධි පුහුණු වියදම්	53,957,101	67,086,812
එකතුව	**336,876,440**	**366,280,209**

11. ප්‍රාග්ධන වියදම් පිළිබඳව විස්තර

විෂයය	2017 රුපියල්	2018 රුපියල්
ගෘහභාණ්ඩ සහ උපකරණ අත්කර ගැනීම	21,923,842	9,486,355
විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ අත්කර ගැනීම	124,000	1,755,000
ග්‍රන්ථ සහ වාර සඟරා අත්කර ගැනීම	3,080,094	6,273,328
ගොඩනැගිලි සඳහා එකතු කිරීම්	196,607,994	-
වෙනත් (උපාධි ලෝගු)	-	132,500
වෙනත් (විදුලි බෙදාහැරීම)	-	-
එකතුව	**221,735,930**	**17,647,183**

12. මූල්‍ය ප්‍රගතිය පිළිබඳව විස්තර (වියදම්)

විෂයය	රජයේ ප්‍රධානයන් 2018	උත්පාදිත ආදායම 2018	වියදම 2018
පුනරාවර්තන වියදම් ව්‍යාපෘතිය	120,000,000	324,988,851	366,280,209
ප්‍රාග්ධන වියදම් ව්‍යාපෘතිය	412,000,000	-	425,612,677
එකතුව	**532,000,000**	**324,988,851**	**791,892,886**

13. මූල්‍ය ප්‍රගතිය පිළිබඳව විස්තර (උත්පාදිත ආදායම)

ආදායම් මූලාශ්‍රය	2018 ප්‍රතිපාදන රුපියල්	2018එකතු වූ මුදල රුපියල්	හිඟය/අතිරික්තය රුපියල්
පශ්චාත් උපාධි අධ්‍යයනය	244,700,000	296,964,122	(52,264,122)
වෙනත්	7,650,000	28,024,729	(20,374,729)
එකතුව	**252,350,000**	**324,988,851**	

14. මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය - 2018

විෂයය	සූත්‍රය	සිසුවකු සඳහා වූ වියදම (රුපියල්)
එක් සිසුවකු/සිසුවියක සඳහා වූ පුනරාවර්තන වියදම	පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව	93,773.73
එක් සිසුවකු/සිසුවියක සඳහා වූ ප්‍රාග්ධන වියදම	පුනරාවර්තන වියදම - සිසුන්/සිසුවියන් සංඛ්‍යාව	108,963.82

15. 2018 වසරේදී ලැබූ යටිතල පහසුකම් පිළිබඳ විස්තර

යටිතල පහසුකම් විස්තර	වියදම රුපියල්	කාර්ය ප්‍රගතිය
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්‍ය දෙපාර්තමේන්තුව සැකසීම සහ කොටස් වෙන් කිරීම	73,800.00	සම්පූර්ණ කර ඇත
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උතුරු කොටසේ ගොඩනැගිල්ලේ සීලිම අළුත්වැඩියා කිරීම	40,000.00	සම්පූර්ණ කර ඇත
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බිත්ති පින්තාරු කිරීම	57,380.00	සම්පූර්ණ කර ඇත
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ විදුලි සෝපාන ආශ්‍රිත ප්‍රදේශ සහ අවපැහැ ගැන්වුනු ප්‍රදේශ පින්තාරු කිරීම.	154,800.00	සම්පූර්ණ කර ඇත
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පිවිසුමෙහි පැති කණුවකට ලිස්සුම් ගේට්ටුවක් සවි කිරීම	23,634.00	සම්පූර්ණ කර ඇත

16. වෙනත් තොරතුරු

16.1 ආයතනික ක්‍රියාකාරකම්

16.1.1.ලියාපදිංචි කිරීම්

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2017 වසර තුළ අධ්‍යයන මණ්ඩල 23 ක සහ විශේෂඥ මණ්ඩල 35 ක සෘජු අධීක්ෂණය යටතේ එම්.ඩී, එම්.එස්.සී, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි පාඨමාලාවන් 124 ක් පවත්වනු ලැබිනි.

එම්.ඩී, එම්.එස්.සී, පී.ජී ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර යන ක්ෂේත්‍රයන්හි උපාධි පාඨමාලාවන් සඳහා පුහුණු වැඩසටහන් සඳහා නවක සිසුන් 1007 ක් ඇතුලත් සමස්තයක් ලෙස 3921 ක් වූ පශ්චාත් උපාධි පුහුණුලාභීන් සංඛ්‍යාවක් බඳවා ගනු ලැබිනි. ඔවුන් අතරින් පුහුණුලාභීන් 3921 දෙනෙකු දේශීය වශයෙන් පුහුණුව ලබන අතර 456 දෙනෙකු විදේශයන්හි වන පිළිගත් පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුව ලබති.

16.1.2. අධ්‍යයන අවධාරණය

2018 වසරේ අධ්‍යයන අවධාරණය කේන්ද්‍රගත වූයේ නව පුහුණු වැඩසටහන් හඳුන්වාදීම , ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂය මාලාවන් සමග ප්‍රමිතිගත වෙමින් සහ නව ශිල්පක්‍රම අන්තර්ග්‍රහණය කරගනිමින් පවතින පුහුණු වැඩ සටහන් සහ උපාධි ප්‍රකාශ පත්‍ර ප්‍රතිශෝධනය කරගැනීම මගින් ඒවායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම කෙරෙහිය.

මෙම වසරේදීද එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, සිංගප්පූරුව, ඉන්දියාව, එක්සත් ඇමෙරිකා රාජධානිය, පකිස්ථානය සහ ටර්කිය යන රටවල පිහිටි විශිෂ්ට මධ්‍යස්ථානයන්හි සිදුකරන එම්.ඩී. උපාධි පරීක්ෂණවල බාහිර විභාග පරීක්ෂකයන්ගේ වාර්තාවන්හි සඳහන් නිර්දේශ පදනම් කරගෙන පුහුණුකරුවන් සහ විභාග පිළිතුරුපත්‍ර පරීක්ෂකයන් නව ශිල්පක්‍රම වලින් සන්නද්ධ කිරීමට මෙන්ම විභාග ආකෘතිපත්‍ර වල තත්ත්වය ඉහළ නැංවීම සහ පුහුණු වැඩසටහන්වල සහ විභාගවල පිළිගතහැකි ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ඔවුනට උචිත මාතෘකා ඔස්සේ වැඩමුළු මාලාවක් පවත්වන ලදී.

නව පුහුණු වැඩසටහන්

2019 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීම පිණිස පහත සඳහන් නව පුහුණු වැඩසටහන්වල උපාධි ප්‍රකාශපත්‍ර සැකසීම සිදු කරනු ලැබිනි

- ඉන්ද්‍රිය බද්ධකිරීම් නිර්විඳ්දනවේදය සහ උග්‍රාවස්ථා උපස්ථානය පිළිබඳව විශේෂ අවධානය සහිත නිර්විඳ්දනවේදය පිලිබඳව මණ්ඩල සහතිකධාරීත්වය.

මෙම වර්ෂය තුළදී පවත්නා වැඩසටහන්වල පහත සඳහන් විෂය ධාරාවන් සහ විස්තර ප්‍රකාශපත්‍ර ප්‍රතිශෝධනය සිදු කරනු ලැබිනි

- හමුදා වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය,
- පර්යේෂණාගාර අණුක ව්‍යාධිවේදය පිලිබඳව එම්.ඩී. උපාධිය

පවතින වැඩසටහන්හි පහත සඳහන් විශය මාලාවන් සහ උපාධි ප්‍රකාශපත්‍ර මෙම වසර තුළදී සංශෝධනය කරන ලදී.

- වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකධාරීත්වය.
- ප්ලාස්ටික් සහ ප්‍රතිනිර්මිත ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය.

- ස්නායු ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය
- වෘක්ක ව්‍යාධිවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය
- මෛත්‍ර ශල්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකධාරීත්වය
- අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන
- වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි වැඩසටහන (වත්මන වනවිට වෘද්ධ චිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි වැඩසටහන ලෙස යළි නම් කර ඇත)

පහත වැඩසටහන් මේ වනවිටත් සංශෝධනය කරමින් පවතී

- වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.ඩී. වැඩසටහන (AAAEC අනුමැතිය සහිත, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂිතය)
- සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
- වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන සහ මණ්ඩල සහතිකකරණය
- සායනික ප්‍රවේණි විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
- වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්.එස්.සී. වැඩසටහන
- ව්‍යවච්ඡේද විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- සාමාන්‍ය දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

16.1.3. පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ

2015 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද පශ්චාත් උපාධි පුහුණුලාභීන් සඳහා සාමාන්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වූ ලේඛණය 2019 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මක කළ හැකිවන පරිදි 208 වසර තුළදී කළමනාකරණ මණ්ඩලය/සෙනේට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අන්තර්ගත කරගනිමින් සංශෝධනය කරනු ලැබිනි.

16.1.4. පුහුණුකරුවන් විභාග පරීක්ෂකවරුන් සහ අධීක්ෂකවරුන් සඳහා පොදු රෙගුලාසි සහ මාර්ගෝපදේශ

පුහුණුකරුවන් විභාග පරීක්ෂකවරුන් සහ අධීක්ෂකවරුන් සඳහා පොදු රෙගුලාසි සහ මාර්ගෝපදේශ පිළිබඳව වන 2016 දී ප්‍රකාශයට පත් කරන ලද ලියවිල්ල කළමනාකරණ මණ්ඩලය සහ සනාථන සභාව විසින් ගනු ලැබූ තීරණ අන්තර්ග්‍රහණය කරගනිමින් 2018 වසරේ සංශෝධනය කරන ලද්දේ 2019 ජනවාරි මස සිට බලාත්මක කිරීම සඳහාය.

වගුව - 1

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන අධ්‍යයන වැඩසටහන්

නිර්වින්දනවේදය	නිර්වින්දනවේදය පිළිබඳව නිපුණතා සහතිකය
-	උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
-	නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
-	පහත ක්ෂේත්‍රයන්හි විශේෂ අවධානයක් සහිතව නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
-	හෘත් උරස්ථ නිර්වින්දනවේදය
-	ස්නායුවේද නිර්වින්දනවේදය
-	ප්‍රසවවේද නිර්වින්දනවේදය
	ළමා චිකිත්සක නිර්වින්දනවේදය
	දැඩි සත්කාර
	වේදනා කළමනාකරණ
	ඉන්ද්‍රිය බද්ධ කිරීම් සහ උග්‍රාවස්ථා උපස්ථානය
	උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව මණ්ඩල සහතිකකරණය
මූලික වෛද්‍ය විද්‍යාවන්	කායව්‍යවච්ඡේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය විද්‍යා භෞතවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
ප්‍රජා වෛද්‍ය විද්‍යාව සහ ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය
	ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී උපාධිය
	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	ප්‍රජා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මානව පෝෂණය පිළිබඳව එම්.එස්.සී උපාධිය
සායනික අර්බුදවේදය	වේදනා නාශක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	මණ්ඩල සහතිකකරණ උපවිශේෂයන්
	ළමා චිකිත්සක අර්බුදවේදය
	රක්තවේද අර්බුදවේදය
දන්ත ශල්‍යවේදය	රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මුඛ හා හනුවක්ත්‍ර ශල්‍ය චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය
	විකලාංග දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය
	පුනර්ජීවන දන්ත චිකිත්සාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
චර්මවේදය	චර්මවේදය පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
පවුල් වෛද්‍ය විද්‍යාව	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පූර්ණ කාලීන - සහභාගීත්ව)
	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (උපාධි නිබන්ධන මගින්)
	පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සායනික පුහුණුව මගින්)

වෝහාරික වෛද්‍ය විද්‍යාව	නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පහත ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානයක් යොදවමින් වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සායනික වෝහාරික වෛද්‍ය විද්‍යාව
	වෝහාරික ධූලකවේදය
	වෝහාරික ළමා චිකිත්සක සහ නවජන්මවේදී ව්‍යාධිවේදය
	වෝහාරික පටක ව්‍යාධිවේදය
	වෝහාරික මානව විද්‍යාව
	වෝහාරික විකිරණවේදය
වෛද්‍ය විද්‍යාව	ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. උපාධිය
	හෘත් වේදය
	වැඩිහිටි හෘත් වේදය
	හෘත් විද්‍යුත භෞතවේදය
	අන්තෝසර්ගවේදය
	ඡඨර අන්ත්‍ර විද්‍යාව
	වෘක්කවේදය
	ස්නායුවේදය
	සායනික ස්නායු භෞතවේදය
	ශ්වසන වෛද්‍ය විද්‍යාව
	සන්ධිප්‍රදාහය සහ පුනරුත්ථාපනය
	පුනරුත්ථාපන වෛද්‍ය විද්‍යාව
වෛද්‍ය පරිපාලනය	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. එස්.සී උපාධිය
	වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
ක්ෂුද්‍රජෛවවේදය	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය ක්ෂුද්‍රජෛවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	උපවිශේෂයන් පිලිබඳව මණ්ඩල සහතිකකරණය
	දිලීරවේදය
	වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය වයිරසවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වෛද්‍ය දිලීර විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
බහු ශික්ෂණ පාඨමාලාවන්	වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍රය
	සෞඛ්‍ය ආංශික ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	වෛද්‍ය ධූලකවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්. එස්. සී. උපාධිය
	අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ එම්.එස්.සී. උපාධිය
	මානව පෝෂණය පිලිබඳව එම්.එස්.සී. උපාධිය
	සායනික ඖෂධවේදය සහ භෞත චිකිත්සනය පිළිබඳව එම්. එස්. සී. උපාධිය
	වෛද්‍ය ධූලකවේදය පිළිබඳව ශාස්ත්‍රපති උපාධිය

	හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	වේදනා සමන උපස්ථානය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	සායනික ඖෂධවේදය සහ භෞත චිකිත්සනය පිළිබඳව මණ්ඩල සහතිකකරණය.
	සායනික පෝෂණය පිළිබඳව එම්. ඩී උපාධිය
නාරිවේදය හා ප්‍රසවවේදය	ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	උපවිශේෂයන් පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	නාරි අර්බුදවේදය
	ඌණ දරුඵළ චිකිත්සාව
	මෛත්‍ර ප්‍රසවවේදය (සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය අපේක්ෂිතය)
අක්ෂිවේදය	අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	උපවිශේෂයන් පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	දෘෂ්ටිපටල ශල්‍යවේදය
	ළමා චිකිත්සා අක්ෂිවේදය
	කෝර්ණියාව සහ බාහිර අක්ෂි රෝග
	කක්ෂි සහ අක්ෂි පිරිසැකසුම
කර්ණනාසික ස්වරාලවේදය	කර්ණනාසික ස්වරාලවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
ළමා චිකිත්සාව	ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ළමා චිකිත්සාව පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	උපවිශේෂයන් පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමා චිකිත්සා නව්‍යස්නුතිවේදය සහ පරිස්නුතික වෛද්‍යවිද්‍යාව
	ළමා චිකිත්සා හෘත්වේදය
	ළමා චිකිත්සා වෘක්කවේදය
	ළමා චිකිත්සා ස්නායුවේදය
	ළමා චිකිත්සා දැඩි සත්කාරය
	ළමා චිකිත්සා අන්තරාසර්ගවේදය
	ළමා චිකිත්සාව සහ පෙනහළු ආශ්‍රිත රෝග
	ප්‍රජා ළමා චිකිත්සාව
ව්‍යාධිවේදය	මූලික පර්යේෂණාගර විද්‍යාවන් පිළිබඳව පශ්චාත් උපාධි සහතික පත්‍රය
	පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	සායනික රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	රක්තවේදය එම්. ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය

මනෝචිකිත්සාව	මනෝචිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මනෝචිකිත්සාව පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	උපවිශේෂයන් පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	වෝහාරික මනෝ චිකිත්සාව
	ළමා හා නවයෞවන මනෝ චිකිත්සාව
	වයෝවෘද්ධ මනෝ චිකිත්සාව
	ඇබ්බැහිවීම් පිළිබඳව මනෝ චිකිත්සාව
විකිරණවේදය	විකිරණවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	උපවිශේෂයන් පිලිබඳව මණ්ඩල සහතිකකරණය
	ළමාචිකිත්සා විකිරණවේදය
	ස්නායු විකිරණවේදය
	අතරමැදි විකිරණවේදය
ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව	ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	ක්‍රීඩා සහ ව්‍යායාම් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම් ඩී උපාධිය
ශල්‍යවේදය	ශල්‍යවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
	පහත ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් ඇතිව සාමාන්‍ය ශල්‍යවේදය
	ඉහළ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය
	Hepato-pancreato-biliary surgery
	පහළ ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය
	වාහිණී ශල්‍යවේදය
	ළය ශල්‍යවේදය
	අන්තරාසර්ග ශල්‍යවේදය
	ක්ෂති ශල්‍යවේදය
	උපවිශේෂයන් පිළිබඳව මණ්ඩල සහතිකකරණය
	ශල්‍ය අර්බුදවේදය
	හෘත් උරස්ථ ශල්‍යවේදය
	ආමාශයික අන්ත්‍ර ශල්‍යවේදය
	ළමා චිකිත්සක ශල්‍යවේදය
	ප්ලාස්ටික් ශල්‍යවේදය
	මෞත්‍ර ශල්‍යවේදය
	වාහිණී ශල්‍යවේදය
	ස්නායු ශල්‍යවේදය
	උරස්ථ ශල්‍යවේදය
	විකලාංග ශල්‍යවේදය පිලිබඳව එම්.ඩී. උපාධිය සහ මණ්ඩල සහතිකකරණය
මෙථුනවේදය	මෙථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
	මෙථුනවේදය පිළිබඳව එම් ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණය

වගු අංක 2

2018/12/31 දිනට විවිධ පුහුණු අදියරයන්හි පසුවන එක් එක් අධ්‍යයන වැඩසටහන්හි වන සමස්ත පුහුණුලාභීන් සංඛ්‍යාව

අධ්‍යයන වැඩසටහන	නව ලියාපදිංචිවීම්	සේවාස්ථ/ සහතිකපත්‍ර 1 කොටස	පශ්චාත් උපාධි පශ්චාත් උපාධි ඩිප්ලෝමා	එම්. එස්. ෂ	පූර්ව එම්.ෂ	පශ්චාත් එම්.ඩි. (දේශීය)	විදේශීය		2017 නැවත පැමිණි		සමස්තය (1-6)
							වසර 2ක් දක්වා	වසර තෙවන වසර	මණ්ඩල සහතිකකරණය ලද	මණ්ඩල සහතිකකරණය ලැබීමට නියමිත	
							(අ)	(ආ)	(ඇ)	(ඈ)	
		1		2	3	4	5		6		
වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව සහතිකපත්‍රය	13	13									13
කායව්‍යවච්ඡේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	මෙම වැඩසටහන 2019 වසරේදී ඇරඹෙනු ඇත										
උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	14		34								34
ළමා සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	18		18								18
වයෝ වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	18		37								37
පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	51		101								101
සෞඛ්‍ය ආංශික ආපදා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	14		37								37
රෝහල් දන්ත පිළිවෙත පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	32		58								58
(ව්‍යාධිවේදය) සායනික රක්තවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	11		42								42
(ව්‍යාධිවේදය) පටක ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			10								10
(ව්‍යාධිවේදය) රසායනික ව්‍යාධිවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			5								5
නීති වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			15								15
වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15		29								29
අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			12								12
වේදනා නාශක වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15		15								15
භෞතවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	10		10								10
මනෝ චිකිත්සාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15		36								36
ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව			6								6
ක්‍රීඩා වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	15		15								15
ක්ෂය රෝගය සහ ළය රෝග පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	41		89								89

පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	8		23								23
මෙථුනවේදය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	6		18								18
ජෙව වෛද්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය	16			75							75
ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය	4			4							4
ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.එස්.සී. උපාධිය	48			48							48
සායනික ඖෂධවේදය සහ භෞත චිකිත්සනය පිළිබඳව එම්. එස්. සී. උපාධිය				13							13
මානව පෝෂණය පිළිබඳව එම්. එස්.සී. උපාධිය	31			54							54
වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. එස්.සී. උපාධිය	31			57							57
අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. එස්.සී. උපාධිය	අවසන් කාණ්ඩය ලියාපදිංචි වීම 2015.05.07 - 2016.06.06 අතරදී										
වෛද්‍ය ධූලක වේදය පිළිබඳව එම්. එස්.සී. උපාධිය				35							35
සේවාස්ථ සායනික අර්බුදවේදය	5	8									8
රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස	8	32									32
පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස	14	55									55
වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස	29	29									29
අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය 1 කොටස	14	19									19
නිර්වින්දනවේදය පිළිබඳව එම්.ඩී උපාධිය	40				134	56	34	3	4	17	248
රසායනික ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය					3	3	4	1		1	12
සායනික අර්බුදවේදය පිළිබඳව එම්.ඩී. උපාධිය	3				21	6	6	1	1	2	37
සායනික පෝෂණය පිළිබඳව එම්. ඩී. උපාධිය	19				25	0					25
ප්‍රජා දන්ත චිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය	4				17	2			2		21
ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	24				95	12	23	1	7	6	144
චර්මවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	5				18	11	13	1	1	4	48
හදිසි අවස්ථා වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	32				83	29	20				132
පවුල් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	5				11	6	6	1	1	1	26
වෝහාරික වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	8				27	11	6	1	2	5	52
වෘද වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්.ඩී. උපාධිය	4				2	0					0
රක්තවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය					8	18	18	3		5	52
සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	13				23	0					23
පටක ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය					8	11	3	2	1	2	27
වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්. ඩී. උපාධිය											

වෛද්‍ය පරිපාලනය පිළිබඳව එම්. ඩී. උපාධිය											
වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	7				23	15	4		2	4	48
වෛද්‍ය පරපෝෂවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය					2	0	1				3
වෛද්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	102				282	205	70	8	13	25	603
නාරිවේදය හා ප්‍රසවවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	25				91	19	24				
ඕ.එම්.* ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	7				18	8	4	1	1		32
අක්ෂිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	14				33	19	15	1		5	73
මුඛ ව්‍යාධිවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය					1	0				1	
දන්ත හනු චිකිත්සාව පිළිබඳව එම්.ඩී. උපාධිය	4				8	6	4		1	1	20
මුඛ ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	මුඛ ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය යන්නෙහි නාමකරණය ඕ එම් එෆ් ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය යනුවෙන් වෙනස් කරන ලදී										
විකලාංග ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	12				32	18	7	1	7	1	66
කර්ණනාසිකස්වරාලවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	5				20	5	2			1	28
ළමාචිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය	48				142	44	37	7	1	6	237
මනෝ චිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය	21				67	20	24	4	3	9	127
විකිරණවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	15				86	31	21	1	2	7	148
පුනර්ජීවන දන්තචිකිත්සාව පිළිබඳව එම්. ඩී. උපාධිය	7				11	7	5		2		25
ක්‍රීඩා හා ව්‍යායාම් වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	8				8	0					8
ශල්‍යවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	42				151	74	44	6	7	17	299
පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී. උපාධිය	8				21	6	3			1	31
මෙථුනවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	6				21	13	5	2		2	43
වෛරසවේදය පිළිබඳව එම්. ඩී. උපාධිය	2				4	2					6
සමස්ත එකතුව	**1007**	**156**	**610**	**286**	**1546**	**672**	**411**	**45**	**60**	**135**	**3921**

සටහන :

(අ) : 2018. 12. 31 වනවිට වසර 2ක කාලයක් තුළ විදේශ පුහුණු ලබමින් සිටින පුද්ගලයන්

(ආ) : 2018. 12. 31 වනවිට වසර 3 වැනි වසර විදේශ පුහුණු ලබමින් සිටින පුද්ගලයන්

(ඇ) : 2018 වනවිට ආපසු පැමිණ මණ්ඩළ සහතිකධාරීත්වය ලබා සිටින පුද්ගලයන්

(ඈ) :2018 වනවිට ආපසු පැමිණ මණ්ඩළ සහතිකධාරීත්වය අපේක්ෂාවෙන් සිටින පුද්ගලයන්

16.1. (අ) වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC)

2018 වසර වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට තවත් සාර්ථක වසරක් වූ අතර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මෙහෙයවන ලද වැඩසටහන් රැසක මූලිකත්වය දැරීමේ අවස්ථාව 2018 වසරේදී ද වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයට හිමිවිය.

අධ්‍යයන කටයුතු

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සම්බන්ධීකරණය කරනු ලබන පාඨමාලාවන්

බහුවිෂය ක්ෂේත්‍ර අධ්‍යයනය පිළිබඳව අධ්‍යයන මණ්ඩලය

1.වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව එම්.ඩී. උපාධිය

වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව යනු වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව දක්වා ගමන් කළ හැකි දස මාසික අර්ධකාලීන පාඨමාලාවකි. 2018 වසරේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව සඳහා අපේක්ෂකයින් 13 දෙනෙකු එක්වූහ. පුහුණුලාභීන් දෙදෙනෙකු 2017 වසරේ වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සහතිකපත්‍ර පාඨමාලාව සඳහා සම්බන්ධ වූ අතර ඒ දෙදෙනාම මේ වනවිට පූර්ව එම්.ඩී. පුහුණුලාභීන් වෙති. පුහුණුලාභීන් දෙදෙනෙකු තම විදේශ පශ්චාත් එම්.ඩී පුහුණු සම්පූර්ණ කළහ.

2.වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී. උපාධිය

මෙය අන්තර්ජාලය භාවිතයෙන් Moodle ඉගෙනුම් කළමණාකරණ ක්‍රමවේදය තුළින් සිදුකෙරෙන ද්විවාර්ෂික දුරස්ථ අධ්‍යයන වැඩසටහනකි. දේශීය පුහුණුලාභීන් නව දෙනෙකු සහ විදේශීය පුහුණුලාභීන් 14 දෙනෙකු වෛද්‍ය ධූලකවේදය පිළිබඳව එම්.එස්.සී. උපාධිය සඳහා සම්බන්ධව සිටිති.

වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් 2018 වසරේදී පුහුණුලාභීන් උදෙසා පවත්වනු ලැබූ වැඩමුළු

2018 වසරේදී පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳ පහත වැඩමුළු පවත්වන ලදී

1. පර්යේෂණ ක්‍රමවේදයන් පිළිබඳ වැඩමුළු
   2018 පෙබරවාරි 19 සහ 26, අප්‍රේල් 24 ,මැයි 14,21 සහ 28 - සහභාගීවූවන් ගණන 48
   2018 ජූලි 16 - 21 - සහභාගීවූවන් ගණන 70
   2108 ඔක්තෝබර් 15 - 20 - සහභාගීවූවන් ගණන 38

2. වෛද්‍ය වෘත්තියේ යෙදීමේදී එහි ආචාරවිධි සහ වෘත්තීකභාවය සම්බන්ධයෙන් එම්.ඩී. පුහුණුලාභීන් සඳහා වැඩමුළුව
   2018 මැයි 18,19,25 සහ 26 - සහභාගීවූවන් ගණන 102
   2018 අගෝස්තු 31, සැප්තැම්බර් 1,7 සහ 8 - සහභාගීවූවන් ගණන 110
   2108 සැප්තැම්බර් 1,7 සහ 8 - සහභාගීවූවන් ගණන 67
   2018 නොවැම්බර් 16,17,23 සහ 24 - සහභාගීවූවන් ගණන 63

3. විකිරණවේදයට අදාළ වාර්තා සැකසීමේ වැඩමුළුව
   2018 පෙබවාරි 25 - සහභාගීවූවන් ගණන 63

4. EMQ සහ SBA ගැටළු වෙත ප්‍රවේශ වන්නේ කෙසේද යන්න පිලිබඳව වැඩමුළුව - ව්‍යාධිවේදය.
   2018 අගෝස්තු 13 - සහභාගීවූවන් ගණන 35

5. පර්යේෂණ ප්‍රස්තුත සැකසීම පිලිබඳව වැඩමුළුව: මෛථුනවේදය

2018 සැප්තැම්බර් 17 සහ 18 - සහභාගීවූවන් ගණන 7

6. ඔබගේ ලිපිය පළ කරන්නේ කෙසේද යන්න පිලිබඳව සහභාගීත්ව අන්තර් ක්‍රියාකාරීවැඩමුළුව 2018 නොවැම්බර් 7 - සහභාගීවූවන් ගණන 25

7. පර්යේෂණ සහාය මධ්‍යස්ථානය මාසික පර්යේෂණ රැස්වීම්

	දිනය	මාතෘකාව	සම්පත් දායක
1	2018 ජනවාරි 25	පරිමාණ ගොඩනැගීම	ආචාර්ය මාධව චන්ද්‍රතිලක
2	2018 පෙබරවාරි 22	ක්‍රමාණුකූල නිරීක්ෂණයන් සහ මේටා විශ්ලේෂණයන් අර්ථ දක්වන්නේ කෙසේද? කෙටි මාර්ගෝපදේශයක්	ආචාර්ය බී. කුමරේන්ද්‍රන්
3	2018 මැයි 24	නව ආචාරවිධි අයදුම්පත සම්පූර්ණ කරන්නේ කෙසේද?	ආචාර්ය අචල ජයතිලක
4	2018 ජූනි 28	පර්යේෂණ ප්‍රස්තුතයක් ලිවීම	ආචාර්ය දිල්ශානි දිසානායක
5	2018 අගෝස්තු 30	රචනා චෞරත්වයෙන් වැලකීම සහ ඔබගේ පර්යේෂණයේ නවතාව හුවාදැක්වීම	ආචාර්ය අසේල ඔලුපේලියාව
6	2018 සැප්තැම්බර් 27	අත්පිටපතක් සකසන්නේ කෙසේද?	මහාචාර්ය උපුල් සෙනරත්
7	2018 ඔක්තෝබර් 25	ඔබගේ දත්ත ඵලදායී ලෙස ඉදිරිපත් කිරීම	මහාචාර්ය ඒ. පත්මේස්වරම්
8	2018 නොවැම්බර් 29	ඔබගේ අයදුම්පත ERC/PGIM වෙත ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව සහභාගීත්ව මාර්ගෝපදේශනය	ආචාර්ය හිමානි මොල්ලිගොඩ

<u>පුහුණුකරුවන් සඳහා වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC) විසින් 2018 වසරේදී පවත්වනු ලැබූ වැඩමුළු</u>

2018 වසරේදී පහත වැඩමුළු පවත්වනු ලැබිණි. ඊට අමතරව අධ්‍යයන මණ්ඩලයන්හි ඉල්ලීම මත අමතර වැඩමුළු සංවිධානය කරන ලදී.

1. පුහුණුකරුවන් පුහුණුකිරීම් අත්හදාබැලීමේ වැඩමුළුව - 2018 පෙබරවාරි 2 - සහභාගීවූවන් ගණන 25
2. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන
   (අ). 2018 ජනවාරි 4 සහ 11 - සහභාගීවූවන් ගණන 94
   (ආ) 2018 ජූලි 21 සහ 28- සහභාගීවූවන් ගණන 24
   (ඇ) 2018 අගෝස්තු 9 සහ 10 - සහභාගීවූවන් ගණන 30
   (ඈ) 2018 අගෝස්තු 5 සහ 6 - සහභාගීවූවන් ගණන 27
3. විභාග පරීක්ෂකවරුන් පුහුණුකිරීමේ වැඩසටහන
   (අ). 2018 ජනවාරි 17 සහ 23 - සහභාගීවූවන් ගණන 57
   (ආ) 2018 මැයි 2 සහ 9 - සහභාගීවූවන් ගණන 59
   (ඇ) 2018 ජූලි 4 සහ 11 - සහභාගීවූවන් ගණන 71
   (ඈ) 2018 සැප්තැම්බර් 12 සහ 19 - සහභාගීවූවන් ගණන 41

4. රක්තවේදය සහ පාරවිලයන වෛද්‍ය විද්‍යාව පිලිබඳව ඇගයුම්කරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව(RCP) - 2018 පෙබරවාරි 22 - සහභාගීවූවන් ගණන 40
5. 'සම්මත කාර්ය ක්‍රමවේදය' පිළිබඳ පුහුණු වැඩසටහන - 2018 මැයි 28 - සහභාගීවූවන් ගණන 8
6. ව්‍යාධිවේදය පිළිබඳව වැඩමුළුව ' විභාග ප්‍රශ්නපත්‍ර සැකසීම' - 2018 ජූනි 8 - සහභාගීවූවන් ගණන 30
7. පෝට්ෆෝලියෝ ඇගයුම පිළිබඳව පුහුණුකරුවන් සඳහා වැඩමුළුව - 2018 ජූලි 31 - සහභාගීවූවන් ගණන 30.

8. මනෝ චිකිත්සක පරීක්ෂකවරුන් පුහුණුකිරීමේ වැඩමුළුව - 2018 සැප්තැම්බර් 21 - සහභාගීවූවන් ගණන 40.
9. මනෝචිකිත්සනය පිලිබඳව එම්.ඩී. විභාගය සඳහා පෝට්ෆෝලියෝ ඇගයුම පිළිබඳව වැඩමුළුව - 2018 ඔක්තෝබර් 15 - සහභාගීවූන් ගණන 20
10. එම්.එස්.සී : බී.එම්. අයි. විශයපථ සැකසීමේ වැඩමුළු - 2018 නොවැම්බර් 08 - සහභාගීවූවන් ගණන 17
11. නාරිවේදය සහ ප්‍රසවවේදය පිළිබඳව පුහුණුකරුවන් සඳහා අධ්‍යයන දිනය - 2018 නොවැම්බර් 26 - සහභාගීවූවන් ගණන 17
12. අපරාධ වගකීම පිළිබඳව සම්මන්ත්‍රණය - වෝහාරික සහ නෛතික ලක්ෂණ - 2018 දෙසැම්බර් 12 - සහභාගීවූවන් ගණන 34
13. 'නිර්විඳ්දනවේදයෙහි සායනික සංරචකයට සිදුකල වෙනස්කම් පිළිබඳව අවසන් එම්.ඩී විභාගය' පිළිබඳ වැඩමුළුව - 2018 දෙසැම්බර් 19 - සහභාගීවූවන් ගණන 35

<u>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය (MERC) විසින් 2018 වසරේදී පවත්වනු ලැබූ වැඩමුළු</u>

1. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳව දැනුවත්කිරීමේ වැඩමුළුව - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය- 2018 ජූලි 25 - සහභාගීවූවන් ගණන 98

<u>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2018 වසරේදී පවත්වනු ලැබූ වැඩමුළු</u>

1. වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව (ERC) පිළිබඳව වැඩමුළුව - 2018 අගෝස්තු 05 - සහභාගීවූවන් ගණන 35

<u>වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාව (JPGIM)</u>

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාවෙහි පරිපාලනමය සහ සංස්කරණ කටයුතු සම්බන්ධීකරණය වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය මගින් සිදුකරනු ලැබේ. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන සඟරාවෙහි පස්වන වෙළුම ලිපි 20 ක් සමග ප්‍රකාශයට පත්කරන ලදී.

වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව (ERC/PGIM)

2018 වසරේදී ප්‍රජා වෛද්‍ය විද්‍යාව/දන්ත වෛද්‍ය විද්‍යාව/වෛද්‍ය පරිපාලනය/ජෛව වෛද්‍ය විඥාපන විද්‍යාව/ උග්‍රාවස්ථා උපස්ථාන වෛද්‍ය විද්‍යාව/ රක්ත ව්‍යාධිවේදය/ සායනික අර්බුදවේදය යනාදිය පිලිබඳව එම්.එස්.සී වැඩසටහන, සෞඛ්‍ය විඥාපන විද්‍යාව පිළිබඳව එම්.ඩී. වැඩසටහන/ වෛද්‍ය විද්‍යාව පිළිබඳව එම්. ඩී උපාධිය/මෙථුනවේදය/ සායනික ඖෂධවේදය/ මනෝ චිකිත්සනය සහ ආපදා කළමණාකරණ එම්.ඩී. උපාධි පුහුණුලාභීන්ගේ අයදුම්පත් 85 ක ප්‍රමාණයක් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව විසින් පරීක්ෂාකර බලනු ලැබිනි. කමිටුවෙහි ලේඛන පරිපාලන කටයුතු උදෙසා සහාය වෛද්‍ය අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානය විසින් සැපයේ.

SIDCER-FERCAP සමීක්ෂණය 2018 අගෝස්තු 9 සිට 11 දැනි දින දක්වා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේදී පැවැත්විනි. සම්බන්ධීකාරක සහ ප්‍රධාන සමීක්ෂක ලෙස ඉන්දියානු ජාතික වෛද්‍ය මේධා ජෝශී සහ නන්දිනි කුමාර් යන අය සහභාගී වූහ.

එක්සත්වීමේ මාර්ගෝපදේශ, මනා සායනික භාවිතයන්හි සම්මතයන් පිළිබඳ ජාත්‍යන්තර කවුන්සිලය, වෛද්‍ය විද්‍යා මාර්ගෝපදේශ පිළිබඳව ජාත්‍යන්තර සංවිධානයන්, ජාතික සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතීන් සහ සෞඛ්‍ය ආශ්‍රිත පර්යේෂණයන්හි ආචාරධර්ම සමාලෝචනය සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සහ ආචාරධර්මීය සමාලෝචන භාවිතයන් ඇගයීම සහ සමීක්ෂණය, EC/IRB සම්මත මෙහෙයුම් ක්‍රමවේද සහ ආචාරධර්ම සමාලෝචනයට අදාළ දේශීය රීති සහ සම්මතයන් පිළිබඳව වන හෙල්සින්කි ප්‍රකාශය සමග අනුගත වීම උදෙසා 2018 නොවැම්බර් 21 දින තායිවානයේ පැවති FERCAP හි පොදු සම්මේලනය අතරතුර පිරිනැමුණු FERCAP සංවිධානය හා එක්ව SIDCER වෙතින් වූ ප්‍රසාදය පළකිරීම වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුව (ERC/PGIM) විසින් පිළිගනු ලැබිනි. වෛද්‍ය වෘත්තික ආචාරධර්ම සමාලෝචන කමිටුවෙහි සභාපති මහාචාර්ය වජිර දිසානායක මහතා විසින් සම්මාන උත්සවය නියෝජනය කරනු ලැබිනි.

16.2. ඇගයුම් සහ විභාග කටයුතු

16.2.1. විභාග

